**ශ්‍රී ලංකා කලා මණ්ඩලය - 2014**

---

ශ්‍රී ලංකා කලා මණ්ඩලයේ 2014 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් වියදම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය සහ 1987 අංක 44 දරන ශ්‍රී ලංකා කලා මණ්ඩල (සංශෝධන) පනතින් සංශෝධිත ශ්‍රී ලංකා කලා මණ්ඩල පනතේ (අධි 278) 15(3) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුලත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3** **විගණකගේ වගකීම**

---

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000- 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

**1.4** **මතය ව්‍යාචනය සඳහා පදනම**

---

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ආදායම් වියදම් ප්‍රකාශනයේ, ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාලව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකිය.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**2.1** **මතය ව්‍යාවනය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

2.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

2.2.1 **ගිණුම් මගින් ප්‍රමාණවත් හෙළිදරව් කිරීම් නොකිරීම**

කලා මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා 2014 ඔක්තෝබර් 31 දින සිට වසර 3ක බදු පදනම මත ලබාගත් ගොඩනැගිල්ල පිළිබඳ කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි. මෙහි බදු කුලී අත්තිකාරම් ලෙස සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යාංශය විසින් 2014 වර්ෂයේදී ගෙවා තිබු රු. 1,740,000 ක්ද සමාලෝචිත වර්ෂය සඳහා ගොඩනැගිලි බදු කුලී ලෙස අමාත්‍යාංශය විසින් ගෙවා තිබු රු. 870,000 ක්ද සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනවල සටහන් මගින් අනාවරණය කර නොතිබුණි.

2.2.2 **ගිණුම්කරණ අඩුපාඩු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ගිණුම්කරණ ක්‍රියාවලිය තුළ ක්‍රමවත් පරිදි පවත්වාගෙන යනු ලබන ලෙජර් ගිණුම් ආශ්‍රයෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතු වුවත් එක් එක් වවුචර් හා රිසිට් පත් වර්ගීකරණය කිරීමෙන් හා ජර්නල් සටහන් ඇතුළත් කළ යුතු ගනුදෙනු ජර්නල් වවුචරය භාවිතයෙන් තොරව ගැලපීම් කිරීමෙන් මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණි. මෙවැනි තත්වයක් යටතේ සියලු ගනුදෙනු ඇතුළත් වුයේද හා අදාළ ගැලපීම් විධිමත් අනුමැතියකින් සිදු වුයේද යන්න විගණනයේදී ගැටළුසහගත විය.

(ආ) ප්‍රවර්තන වර්ෂය තුළ නිරවුල් නොවු අත්තිකාරම් නොතිබුණද සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් ලෙස රු. 20,000 ක් ජංගම වත්කම් යටතේ දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ඉතිරිව තිබුණු කලා මණ්ඩලය විසින් ප්‍රකාශනය කරන ලද පිරිවැය රු. 468,877 ක්වූ ග්‍රන්ථ තුනක පිටපත් 961 ක් හා කලා සඟරා 766 ක තොගයේ පිරිවැය මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කර නොතිබුණි. එසේම සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාගේ ඉල්ලීම මත අමාත්‍යවරයාගේ අවශ්‍යතාවය සඳහා සමාලෝචිත වර්ෂයේදී ලබාදී තිබූ පිරිවැය රු. 57,648 ක් වූ ග්‍රන්ථ 151 ක් හා කලා සඟරා 73 ක් පිළිබඳ කිසිදු අනාවරණය කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදු කර නොතිබුණි. තවද අලෙවිකර මුදල් එවීමේ පදනම මත බාහිර ආයතන 5 ක් වෙත 2012 වර්ෂයේදී ලබාදී තිබූ ග්‍රන්ථ 3 ක පිටපත් 150 ක් සඳහා අදාල මුදල් වටිනාකම් අයකර නොතිබුණු නමුත් එම පොත් සම්බන්ධයෙන් කිසිදු හෙළිදරව් කිරීමක් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කලා සඟරා මුද්‍රණය කිරීම වෙනුවෙන් මුද්‍රණ ආයතනයකට ගෙවිය යුතුව තිබූ රු. 148,589 ක් උපචිත වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර නොතිබුණි.

(ඉ) නිලධාරීන් 3 දෙනෙකු වෙත ලබාදී තිබූ උත්සව අත්තිකාරම් රු. 15,000 ක් සාවද්‍ය ලෙස ආදායම් වියදම් ගිණුමට කපාහැර තිබීමෙන් වර්ෂයේ වියදම රු. 15,000 කින් වැඩිවී තිබූ අතර, කාර්ය මණ්ඩලයේ තුන් දෙනෙකුගෙන් අය වූ උත්සව අත්තිකාරම් වාරික වැටුප් ගිණුමට හා රාජකාරි දීමනා ගිණුමට ඇතුළත් කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ වැටුප් හා රාජකාරී දීමනා වියදම් රු. 14,000 ක් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඊ) ප්‍රවර්තන වර්ෂයේ වියදම් විෂයයන් 4 කට අදාලව කරන ලද රු. 328,004 ක් වූ වැය දැරීම් නියමිත පරිදි වර්ගීකරණය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(උ) ඉකුත් වර්ෂය වෙනුවෙන් ලැබී තිබුණු රු. 30,336 ක ස්ථාවර තැන්පතු පොළී ආදායම් සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු අතර, ප්‍රවර්තන වර්ෂය වෙනුවෙන් ලැබිය යුතු රු. 20,733 ක පොළී ආදායමක් සමාලෝචිත වර්ෂයේ ආදායමට ඇතුළත් කර නොතිබුණි. මේ අනුව ප්‍රවර්තන වර්ෂයේ පොළී ආදායම රු. 9,603 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද ලැබිය යුතු පොළී ආදායම් රු. 20,733 ක් ජංගම වත්කම් යටතේ දක්වා නොතිබුණි.

## 2.3 නීති,රීති හා රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත | 2005 අගෝස්තු 01 දින සිට කොන්ත්‍රාත් පදනම මත සේවයට බඳවාගෙන තිබූ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් දෙදෙනකු සඳහා මෙම පනතේ විධිවිධාන පරිදි 2005 වර්ෂයේ සිට පාරිතෝෂික වෙනුවෙන් ප්‍රතිපාදන සලසා නොතිබුණි. |
| (ආ) | 1985 අංක 01 දරන සේවක අර්ථසාධක අරමුදල් සංශෝධන පනත | සේවකයින්ගේ වැටුප් හා අනෙකුත් දීමනා පදනම් කරගෙන සේවක අර්ථසාධක අරමුදල් ගණනය කළ යුතු වුවද මණ්ඩලය විසින් මූලික වැටුප පදනම් කරගෙන සේවක අර්ථසාධක අරමුදල් ගණනය කර තිබුණි. ඒ අනුව නිලධාරීන් 5 දෙනකුගේ අර්ථසාධක අරමුදල් රු. 62,834 ක් අඩුවෙන් ප්‍රේෂණය කර තිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය VI පරිච්ඡේදයේ 5.1 වගන්තිය | කාර්ය මණ්ඩලයේ පෞද්ගලික ලිපිගොනු මාණ්ඩලික නිලධාරියෙකු භාරයේ ආරක්ෂිතව පවත්වාගෙන යා යුතු වුවත් කලා මණ්ඩලයේ කාර්ය මණ්ඩල පෞද්ගලික ලිපිගොනුවල භාරකාරත්වය හා ආරක්ෂාව සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |

| | |
|---|---|
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 371(2) (ආ) (ඇ) | ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම අදාල කාර්යය නිමවූ වහාම සිදුකළ යුතු වුවද නිලධාරීන් 10 දෙනෙකු විසින් අවස්ථා 18කදී ලබාගෙන තිබුණු තත්කාර්ය අතුරු අග්‍රිමවලින් ඉතිරි වූ රු. 95,860 ක මුදල පියවීම සඳහා දින 32 සිට 75 දක්වා කාලයක් ගතකර තිබුණි.<br><br>මාණ්ඩලික ශ්‍රේණියේ නොවන නිලධාරීන් 10 දෙනෙකු විසින් අවස්ථා 19 කදී රු. 20,000 ඉක්මවා ලබාගෙන තිබූ තත්කාර්ය අතුරු අග්‍රිමවල එකතුව රු. 869,390 ක් විය. |
| (ii) මුදල් රෙගුලාසි 756 | සෑම වර්ෂයකම දෙසැම්බර් 15 හෝ ඊට ආසන්න දිනකදී භාණ්ඩ සමීක්ෂණයක් සිදුකළ යුතු වුවද මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණය සිදුකර නොතිබුණි. |
| (ඉ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2002 නොවැම්බර් 28 දිනැති IAI/2002/02 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය | චක්‍රලේඛයේ උපදෙස් පරිදි ස්ථාවර වත්කම් ලේඛනයක් හා පරිඝනක වත්කම් ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2.4 ප්‍රමාණවත් අධිකාරි බලයකින් තහවුරු නොවූ ගනුදෙනු

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමණ්ඩල කමිටු රැස්වීමක් සඳහා අනුමණ්ඩල ලේකම්, සහකාර ලේකම්, කාර්යාල කාර්ය සහායක සහ කලා මණ්ඩලයේ ලේකම්, සහකාර ලේකම් හා කාර්යාල කාර්ය සහායක යන නිලධාරීන් අනුමණ්ඩල කමිටු රැස්වීම්වලට සහභාගී වීම වෙනුවෙන් දීමනා ලෙස රු. 197,800 ක මුළු මුදලක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි. සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ ස්ථිර සේවකයන් වන මෙම නිලධාරීන්ට

අමතර දීමනා ගෙවීම සඳහා ආයතන සංග්‍රහයේ IX පරිච්ඡේදයේ 1.2 වගන්තිය හා 1999 මැයි 04 දිනැති අංක 374 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ආයතන අධ්‍යක්ෂකගේ සහ භාණ්ඩාගාරයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) 1952 අංක 18 දරන පනතින් ශ්‍රී ලංකා කලා මණ්ඩලය පිහිටුවීමේ අරමුණු යටතේ බාහිර පුද්ගලයන්ට පරිත්‍යාග හා ආධාර වශයෙන් අනුග්‍රහයන් දැක්විය හැකි බවට විධිවිධාන සලසා නොතිබු නමුත් සමාලෝචිත වර්ෂය තුලදී ත්‍යාග හා ආධාර ලබාදීම සඳහා මණ්ඩලය විසින් රු.345,000 ක් වැය කර තිබුණු අතර මේ සඳහා කිසිදු නිර්ණායකයක් පදනමක් හෝ ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලය රු. 265,829 ක ඌණතාවයක් වු අතර ඉකුත් වර්ෂය සඳහා ඊට අනුරූපී ඌණතාවය රු. 241,052ක් විය. ඉකුත් වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 24,777 ක පිරිහීමක් ඇති වී තිබුණි. සමාලෝචිත වර්ෂයේ සමස්ත ආදායම රු. 858,665 කින් වැඩිවී තිබුණද මුළු වියදම රු. 883,442 කින් වැඩිවී තිබීම මෙකී පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

------------------------------

### 4.1 කාර්ය සාධනය

-------------------

මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා භෞතික කාර්යසාධන වාර්තා පිළියෙල කර නොතිබුණු අතර මූල්‍ය කාර්යසාධන වාර්තා අනුව සමාලෝචිත වර්ෂයේදී රු. 2,750,000 ක් වැයකර ඉටුකිරීමට සැලසුම් කර තිබුණු වැඩ සටහන් 9 ක මූල්‍ය ප්‍රගතිය ශුන්‍ය විය.

4.2 **කළමනාකරණ අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මාර්තු මාසයේදී වාරියපොලදී පැවැත්වූ දේශීය කලාකරුවන් හඳුනා ගැනීම හා සවිබල ගැන්වීම් වැඩමුළුවේදී ඡායාරූප ගැනීම සහ වයඹ පළාතේ කලාකරු නාමාවලියක් සකස් කිරීම වෙනුවෙන් රු. 83,598 ක් වැය කර තිබූ නමුත් කලාකරුවන්ගේ නාමාවලිය සකස් කිරීමේ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) සුළු මුදල් අග්‍රිමය මගින් ගෙවීම් කළ යුත්තේ එදිනෙදා ඇතිවන සුළු වටිනාකම්වලින් යුත් හදිසි අවශ්‍යතා වියදම් වුවත් මණ්ඩලය විසින් මාසික ජල බිල්පත්ද සුළු මුදල් අග්‍රිමය මගින් ගෙවා තිබුණි.

(ඇ) ආයතනයේ සේවය කරනු ලබන නිලධාරීන් සඳහා ලිඛිත රාජකාරි පැවරීමක් කළමනාකාරීත්වය විසින් සිදුකර නොතිබුණි.

4.3 **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

දකුණු කොරියාවේ පැවැත්වූ නර්තන කම්ටු රැස්වීමක් සඳහා සහභාගී වූ නාට්‍ය අනුමණ්ඩලයේ සාමාජිකයින් දෙදෙනකුගේ අනියම් වියදම් දීමනා ලෙස රු. 74,600 ක් ගෙවා තිබුණද ඒ සඳහා සමාලෝචිත වර්ෂයට අදාළ වාර්ෂික ඇස්තමේන්තුවේ හෝ ක්‍රියාකාරී සැලැස්මෙහි ප්‍රතිපාදන සලසා නොතිබුණි.

4.4 **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

කලා මණ්ඩලයේ කාර්යාලය පවත්වාගෙන යාම සඳහා සමාලෝචිත වර්ෂයේ ඔක්තෝම්බර් මාසයේ බදු පදනම මත ලබාගත් ගොඩනැගිල්ලේ මුළු වර්ග ප්‍රමාණය වර්ග අඩි 3200 ක් වූ අතර වර්ග අඩි 830 ක පමණ ඉඩ ප්‍රමාණයක් කිසිදු ප්‍රයෝජනයට නොගෙන නිෂ්ක්‍රීයව පැවතුණි.

4.5 **අරමුණුවලට පටහැනි ගනුදෙනු**

අමාත්‍යවරයාගේ ප්‍රණාම උළෙලක් වෙනුවෙන් ගීතයක් රචනා කිරීම, සංගීතවත් කිරීම හා පටිගත කිරීම වෙනුවෙන් මණ්ඩලය විසින් රු. 48,300 ක් වැය කර තිබුණු අතර

අමාත්‍යවරයාගේ සම්බන්ධීකරණ ලේකම්වරයෙකුගේ ඉල්ලීම මත වැඩමුළු 2 ක් සඳහා වතුර බෝතල් මිලදී ගැනීමට රු. 34,384 ක වියදමක් දරා තිබුණි.

## 4.6 කාර්ය මණ්ඩල පරිපාලනය

ප්‍රධාන විධායක නිලධාරී ඇතුළු තනතුරු 6 ක් සඳහා බඳවා ගැනීමට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාදී තිබුණද ඒ අතරින් ප්‍රධාන විධායක නිලධාරී (මණ්ඩලයේ ලේකම්) තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු පත් කිරීම සමාලෝචිත වර්ෂය අවසානය තෙක් සිදුකර නොතිබු අතර වර්ෂ 2 පමණ කාලයක සිට සංස්කෘතික කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරියකු වැඩ බැලීමේ පදනම මත පත් කර තිබුණි.

## 5. පද්ධති හා පාලනය

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන දුර්වලතා පිළිබඳ මණ්ඩලයේ සභාපතිවරයා වෙත වරින්වර දැනුම්දෙන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) ගිණුම්කරණය

(ආ) තොග පාලනය (ග්‍රන්ථ හා සඟරා)

(ඇ) මණ්ඩලයේ රැස්වීම් හා අනුමණ්ඩල කමිටු රැස්වීම්